# An Investigative Study of the Peculiarities of Tantrayāna as one of the School among Buddhist Traditions

## බෞද්ධ සම්ප්‍රදායයන් අතර තන්ත්‍රයානයේ සුවිශේෂතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

ප්‍රාග් බෞද්ධ යුගයේ භාරතීය සමාජය තුළ නිර්මාණය වූ 'තන්ත්‍ර' නම් ශාස්ත්‍රය කවදා, කවරෙකු විසින්, කුමක් අරභයා නිර්මාණය කළේදැයි නිශ්චිතවම ප්‍රකාශ කළ නොහැක්කකි. මානව සංහතියේ ආරම්භය දක්වාම එහි අතීතය දිවයන බව බොහෝ වියතුන්ගේ පිළිගැනීමයි. මෙකී තන්ත්‍ර ශාස්ත්‍රයේ ආභාසය බුදුසමයට ඇතුල්වීමත් සමඟ පසුකාලීනව තන්ත්‍රයානය නමින් වෙනම බෞද්ධ සම්ප්‍රදායයක් නිර්මාණය විය. ඓතිහාසික අතින් බලන කළ එය තෙවැනි බෞද්ධ සම්ප්‍රදායයි. ථෙරවාදය පැරණි ම බෞද්ධ සම්ප්‍රදාය ලෙස බොහෝ පිරිසක් පිළිගන්නා අතර මහායානයට හිමි වන්නේ දෙවන ස්ථානයයි. නමුත් තන්ත්‍රයානිකයින් ස්වසම්ප්‍රදායෙහි ආරම්භය බුදුරජාණන්වහන්සේට ම පවරා ඇත. බුද්ධත්වයෙන් දොළොස්වන වසරේ ශ්‍රීධානකටයේ දී බුදුන්වහන්සේ විසින් මෙම දේශනාවන් සිදුකොට ඇති බව පවසන ඔවුහු, එම දේශනාවන් බුදුන් වහන්සේගේම ඉල්ලීම පරිදි ධර්මය අවබෝධ කරගැනීමට සමත් පිරිස් ලොව පහළ වන තෙක් වජ්‍රසත්ව නම් මහා සිද්ධවරයා දකුණු ඉන්දියාවේ චෛත්‍යයක නිදන් කොට තිබූ බව පවසති. මෙම චෛත්‍යය විවෘත කොට ආචාර්ය නාගාර්ජුන පාදයන් විසින් තන්ත්‍රයානය ලොව ප්‍රචාරය කළ බව ඔවුන්ගේ විශ්වාසයයි. තාන්ත්‍රික බුදුසමය අනෙකුත් බෞද්ධ සම්ප්‍රදායයන් හා සසැඳීමේ දී දැකගතහැකි සුවිශේෂතා රාශියකි. ඉන් කිහිපයක් පිළිබඳ මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කොට ඇත.

තන්ත්‍ර, මන්ත්‍ර, යෝගාදී ප්‍රායෝගික ක්‍රියාමාර්ග ද, මණ්ඩල, ධාරණී, ධාකිණී ආදි සංකේත භාවිතය ද අභිමථාර්ථ ඉටුකර ගැනීම සඳහා ඵලදායි උපාය මාර්ග ලෙස සැළකීම තන්ත්‍රයානයේ දැකගත හැකි සුවිශේෂ ලක්ෂණයකි. ඒ අනුව ලෞකික ලෝකයේ අරමුණු සඵල කරගැනීම සඳහා සරල ක්‍රියා මාර්ග විවිධ උපායයන් ලෙස තන්ත්‍රයානයේ භාවිත කිරීම වේ. මන්ත්‍ර යන වචනය ශබ්ද කිරීමෙන් පවා කිසියම් ගුප්ත ශක්තියක් අවදි කරන බව ඔවුන්ගේ පිළිගැනීමයි. ඒ තුළින් පෙනෙන නොපෙනෙන බලවේග පාලනයටත් තමන්ට අවශ්‍ය පරිදි මෙහෙයවීමටත් හැකියාව ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයයි. එපමණක් නොව, ලෞකික වශයෙන් සියලු අභිමථාර්ථ සාධනය කර ගැනීමටත් මෙයින් අවස්ථාව උදා වේ. ලෞකික අරමුණු ලෙස ආරක්ෂාව, සෞභාග්‍ය, නිරෝගිකම, අංජන හෙවත් නොපෙනෙන දේ දැකීම හා දැනීම, නොපෙනෙන සේ ගමන් කිරීම, අන්තර්ධාන හෙවත් අතුරුදන් වීම, අහසින් යාම, ආදිය දැක්වේ. ලෝකෝත්තර වශයෙන් මන්ත්‍රාදි ගුඪ මාධ්‍ය උපයෝගි කරගනිමින් විමුක්තිය ද උදාකර ගත හැකි ය යන්න ඔවුන්ගේ ආකල්පයයි.

තාන්ත්‍රික බුදුසමයේ ගුරුකේන්ද්‍රියතාව ද තවත් සුවිශේෂී ලක්ෂණයකි. මන්ත්‍ර භාවිතයේ දී ගුරු කේන්ද්‍රිය භාවය ඉතා වැදගත් වේ. ගුරුවරයෙකුගෙන් ප්‍රකට වන මූලික ලක්ෂණ දෙකකි. 01. නිසි මාර්ගෝපදේශකත්වය සැපයීමට සුදුසුකම් සපුරා තිබීම. 02. ඕනෑම විටෙක ශිෂ්‍යයාට පිහිටවීම සඳහා කරුණා මනසක් ඇති බව. තාන්ත්‍රික බුදුසමයේ උගන්වන සියලු ධර්ම ගුප්ත ශාස්ත්‍රයන් සේ සැළකේ. එහි අන්තර්ගතය සාමාන්‍ය පාඨකයෙකුට කියවා තේරුම් ගැනීම අපහසුය. මේ නිසා හසල දැනුමක් ඇති ගුරුවරයෙකු විසින් මගපෙන්වීම අත්‍යාවශ්‍යය. මෙවැනි ගුරුවරු සිද්ධයන් හෙවත් සිද්ධාචාර්යවරු ලෙස හඳුන්වති. ඔවුන් තුළ ඥානය ද කරුණාව ද ඉහළින්ම ක්‍රියාත්මක වේ. තාන්ත්‍රික ඉගැන්වීම් තේරුම් ගැනීමේ හැකියාවත් සියලු සත්ත්වයන් කෙරෙහි දැක්විය යුතු ආකල්පයත් ඔවුන් සතු වේ. ආධ්‍යාත්මික වශයෙන් ඉහළ තලයේ පසුවන ගුරුවරයා සත්‍යයේ ප්‍රතිමූර්තිය, මිහිපිට දෙවිවරු, සුගත නැතහොත් ධාමකාය (බුදුවරු) ලෙස සළකනු ලැබේ.

තාන්ත්‍රික බුදුසමයේ විමුක්තිය පිළිබඳ සංකල්පයට නව වටිනාකමක් ආරෝපණය කර ඇත. නිර්වාණය මහා සුඛය ලෙස හඳුන්වයි. එය ලැබිය යුත්තේ මරණයෙන් පසුවය. මෙලොව දී සිදුකරන්නේ විමුක්තියට අදාළ ප්‍රතිපදාව සම්පූර්ණ කිරීමයි. තාන්ත්‍රික මූලධර්මවල විමුක්තිය පිළිබඳ වූ ප්‍රතිපදා මාර්ගය විග්‍රහ කරන්නේ රාගාදී අරමුණු බැහැර කිරීමෙන් තොරවය. ඉන්ද්‍රිය අරමුණු ඇලීම බැඳීම ගැටීම සහ විරහව යනාදී ලෙසින් එකිනෙකට සංයෝග වූ ක්‍රියාවලියක් මගින් තුළින් සත්‍යාවබෝධය ලැබීම මෙමගින් නිර්දේශිත උපාය මාර්ගයයි.

තාන්ත්‍රික බුදුසමයේ ශක්තිවාද හා චර්යා යනුවෙන් හඳුන්වන සුවිශේෂ ඉගැන්වීමක් ද දැකගත හැකි ය. මෙය ශක්තිවාද සහ වාමාචාර යන නම් වලින් ද හැඳින්වේ. ශක්තිය යනු ප්‍රඥාවයි. ප්‍රඥාවෙන් සියල්ල නිපදවෙයි. ප්‍රඥාව සංකේතවත් වන්නේ කාන්තා රූපයකිනි. කලක් යන විට ප්‍රඥාව දෙවඟනක් විය. දෙවඟනක් වූ ප්‍රඥාව උත්පාදක බලය හෙවත් ප්‍රජනන ශක්තිය ඇති තැනැත්තියක් ලෙස සළකා වැඳුම් පිදුම් කිරීමට පටන් ගත්තේ ය. කල්ගත වන විට මෙම ශක්තිය හෙවත් ප්‍රඥාව බෝසත්වරුන් සතු වන්නේ යැයි ප්‍රකට කිරීමට බෝසතුන් වැළඳගෙන සිටින කාන්තාවන්ගේ රූප නිර්මාණය විය. තන්ත්‍රයානයේ සංකේත අතර මෙලෙස බුදුවරු හා හා බෝසත්වරු කාන්තාවන් සමඟ වෙලී සිටින පරිදි නිරූපනය කිරීමෙන් අර්ථවත් වන්නේ කරුණාවේ හා ප්‍රඥාවේ සුසංයෝගයයි.

මෙවැනි තාන්ත්‍රික බුදුසමයට අනන්‍ය වූ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් මෙම පර්යේෂණය තුළ අධ්‍යයනය කොට ඇත.

ප්‍රමුඛ පද :ගුහ්‍ය ධර්ම,තන්ත්‍ර, තන්ත්‍රයානය, නිර්වාණය, සංකේත.